# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2011 අංක 15 දරන මුදල් (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2011 මාර්තු මස 31 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2011 අප්‍රේල් මස 01 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. 8.00 යි. **තැපැල් ගාස්තුව :** රු. 15.00 යි.

## 2011 අංක 15 දරන මුදල් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2011 මාර්තු මස 31 වන දින]

එල්.ඩී.—ඕ. 6/2011

**2006 අංක 11 දරන මුදල් පනත, 2005 අංක 5 දරන මුදල් පනත, 2003 අංක 25 දරන මුදල් පනත සහ 1995 අංක 16 දරන මුදල් පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

1. මේ පනත 2011 අංක 15 දරන මුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

I වන කොටස

**2006 අංක 11 දරන මුදල් පනතේ I වන කොටස සංශෝධනය කිරීම**

2. 2006 අංක 11 දරන මුදල් පනතේ I වන කොටසේ 2 වන වගන්තියේ (ආ) ඡේදයේ (ii) වන අනුඡේදයේ " (ii) මේ පනත ක්‍රියාත්මක වීමේ දින සිට සහ ඉන්පසුව," යන වචන සහ ඉලක්කම්වල සිට "2006 අංක 10 දරන දේශීය ආදායම් පනත ප්‍රකාරව" යන වචන සහ ඉලක්කම් දක්වා වූ වචන හා ඉලක්කම් ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 2006 අංක 11 දරන පනතේ I වන කොටසේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ii) මේ පනත ක්‍රියාත්මක වීමේ දින සිට සහ ඉන්පසුව—

(අ) ඉහත (i) වන ඡේදයේ සඳහන් අනුග්‍රාහකත්වය එම ඡේදය ප්‍රකාරව ලබාගෙන නොමැති ; හෝ 2001 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන සහ 2011 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන අඛණ්ඩ තක්සේරු වර්ෂ යම් පහක යම් කාලසීමාවක් සඳහා ; හෝ

(ආ) ඉහත (i) වන ඡේදයේ සඳහන් අනුග්‍රාහකත්වය එම ඡේදය ප්‍රකාරව ලබා ගෙන නොමැති හෝ 2001 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අඛණ්ඩ තක්සේරු වර්ෂ දහයක යම් කාලසීමාවක් සඳහා

අවස්ථාවෝචිත පරිදි, 2000 අංක 38 දරන දේශීය ආදායම් පනත හෝ 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත ප්‍රකාරව ආදායම් බදු ගෙවා ඇත්තා වූ ද”.

## II වන කොටස

### 2005 අංක 5 දරන මුදල් පනතේ I වන කොටස සංශෝධනය කිරීම

2005 අංක 5 දරන පනතේ I වන කොටසේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** (මේ කොටසේ මින්මතු “ප්‍රධාන ප්‍රඥප්තිය” යනුවෙන් සඳහන් කරනු ලබන) 2005 අංක 5 දරන මුදල් පනතේ I වන කොටසේ (සමාජ වගකීම් බද්ද පැනවීම) 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එම වගන්තියේ (ඇ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :-

“(ඇ) 2008 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වන සහ-

(i) 2010 නොවැම්බර් මස 22 වන දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා (52 වන අධිකාරය වූ) සුරාබදු ආඥාපනත, (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනත සහ 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ අයකරනු ලැබිය හැකි සමාජ වගකීම් බද්ද සම්බන්ධයෙන්; සහ

(ii) 2011 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන යටතේ අයකරනු ලැබිය හැකි සමාජ වගකීම් බද්ද සම්බන්ධයෙන්,

වර්ෂයකට සියයට 1.5ක අනුප්‍රමාණයකට:”;

(2) එම වගන්තියේ දෙවන අතුරු විධානයේ (ii) වන අනුඡේදය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් අනුඡේදය ආදේශ කිරීමෙන් :-

“(ii) 2008 අප්‍රේල් මස 1 වන දින සිට ආරම්භ වන සහ 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව වූ කාලසීමාව සම්බන්ධයෙන් සියයට 1.5ක අනුප්‍රමාණයකට :”.

**4.** (සමාජ වගකීම් බද්ද පැනවීම) සම්බන්ධයෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ 6 වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අලුත් අයිතමය ආදේශ කිරීමෙන් එම උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :- ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

"6. (XVIවන, XVIIවන, XXIවන, පරිච්ඡේදවල සහ 36 වන සහ 65 වන වගන්තිවල විධිවිධාන හැර) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත යම් සමාගමකට අදාළ වන තාක් දුරට සහ 2008 අප්‍රේල් මස 1 වන දින සිට සහ ඉන්පසුව ආරම්භව 2011 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන කාලසීමාව දක්වා වූ කාලසීමාවට අදාළ වන තාක් දුරට"

III වන කොටස

**2005 අංක 5 දරන මුදල් පනතේ II වන කොටස සංශෝධනය කිරීම**

**5.** 2005 අංක 5 දරන මුදල් පනතේ II වන කොටසේ (කොටස් ගනුදෙනු බද්ද පැනවීම) 7 වන වගන්තිය 2011 ජනවාරි මස 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කිරීමෙන් එම කොටස මෙයින් සංශෝධනය කරනු ලැබේ:- 2005 අංක 5 දරන පනතේ 7 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"කොටස් ගනුදෙනු බද්ද පැනවීම.

7. කොටස් වෙළෙඳපලක් මගින් පවත්වාගෙන යනු ලබන සෑම කොටස් වෙළෙඳාම් ගනුදෙනුවක ම පිරිවැය මත, සෑම මිලදී ගන්නකුගෙන් ම සහ විකුණුම්කරුවකුගෙන් ම—

(අ) 2005 ජනවාරි මස 1 වන දින සිට ආරම්භව 2011 ජනවාරි මස 1 වන දිනයට පෙරාතුව වූ කාලසීමාව සඳහා සියයට 0.2 ක අනුප්‍රමාණයකට; සහ

(ආ) 2011 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන කාලසීමාව සඳහා සියයට 0.3 ක අනුප්‍රමාණයකට,

කොටස් ගනුදෙනු බද්ද යනුවෙන් හඳුන්වනු ලබන බද්දක් පනවනු ලැබිය යුතුය.

වගකීමෙන් මුක්ත කිරීම.

**6.** 2011 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වී මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ දී පනතේ මේ කොටස ප්‍රකාරව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් කොටස් ගනුදෙනු බද්ද අයකරනු ලැබ එකතු කරනු ලැබ ඇති අවස්ථාවක දී, එම බද්ද වලංගු ලෙස අයකරනු ලැබ එකතු කරනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර එකී බද්ද එකතු කිරීම සම්බන්ධයෙන් යම් සිවිල් හෝ අපරාධ නඩු පැවරීමකින් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා මෙයින් වගකීමෙන් මුක්ත කරනු ලැබේ.

IV වන කොටස

**2005 අංක 5 දරන මුදල් පනතේ III වන කොටස සංශෝධන කිරීම**

2005 අංක 5 දරන පනතේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

**7.** 2005 අංක 5 දරන මුදල් පනතේ III වන කොටසේ (ඉදිකිරීම් කර්මාන්ත සහතික අරමුදල බද්ද) 13 වන වගන්තිය 2011 ජනවාරි මස 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එම වගන්තිය එම වගන්තියේ (1) වන උපවගන්තිය යනුවෙන් නැවත අංක කිරීමෙන්;

(2) (1) වන උපවගන්තිය ලෙස නැවත අංක කරන ලද උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන් :-

"(2) 2011 ජනවාරි මස 1 වන දින සිට සහ ඉන්පසුව මුදල් අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද යම් නිශ්චිත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා වූ කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් ස්වකීය කොන්ත්‍රාත්තු වටිනාකම මත යම් ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවකු විසින් ශ්‍රී ලංකාවේ දී ඇතුළත් වී බලාත්මක කරන ලද යම් ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවක් මත කිසිම ඉදිකිරීම් කර්මාන්ත සහතික අරමුදල බද්දක් අයකරනු නොලැබිය යුතු ය.".

V වන කොටස

**2003 අංක 25 දරන මුදල් පනතේ II වන කොටස සංශෝධනය කිරීම**

8. 2003 අංක 25 දරන මුදල් පනතේ (II වන කොටසේ) 13 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් කොටස මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය එම පනතේ IIඅ කොටස ලෙස බලාත්මක විය යුතු ය :-

2003 අංක 25 දරන පනතට IIඅ අලුත් කොටස ඇතුළත් කිරීම.

IIඅ කොටස

**තරුපහේ හෝටල්වල කාමර සඳහා බද්ද**

කාමර ගාස්තුව එක්සත් ජනපද ඩොලර් එකසිය විසිපහකට වඩා අඩු වන තරුපහේ හෝටල් විසින් බදු ගෙවීම.

13අ. (1) 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 53 වන වගන්තිය යටතේ කරනු ලබන මිල නියෝග නියමයක් ප්‍රකාරව, අවම ගාස්තුව අය කිරීමේ කාර්යය සඳහා "තරුපහේ හෝටලයක්" ලෙස වර්ගීකරණය කර ඇත්තා වූ ද, කොළඹ මහ නගර සභා බල ප්‍රදේශය තුළ සහ දෙහිවල-ගල්කිස්ස මහ නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇත්තා වූ ද, සෑම හෝටලයක් ම එක් කාමරයකට එක්සත් ජනපද ඩොලර් එකසිය විසිපහකට අඩු අනුප්‍රමාණයකට කාමර ගාස්තු අයකරනු ලබන කාමරවලින් සමන්විත වන්නේ නම්, ඒ හෝටල්වල සෑම කාමරයක් සම්බන්ධයෙන් ම එක්සත් ජනපද ඩොලර් විස්සක් හෝ ඊට සමාන ශ්‍රී ලංකා රුපියල් ගණනකින් යුතු බද්දක්, 2011 අප්‍රේල් මස 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි ගෙවීමට නියම කරනු ලැබිය යුතු ය."

(2) (1) වන උපවගන්තිය යටතේ පනවන ලද බද්ද මේ කාර්යය සඳහා (3) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද මාර්ගෝපදේශවල නිශ්චිතව දක්වා ඇති ආකාරයට ගෙවනු ලැබිය යුතු අතර, 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා විසින් 2011 අප්‍රේල් මස 1 වන දින සිට සෑම මසකට වරක් රැස් කරනු ලැබිය යුතු ය. ඒ බද්ද ගෙවිය යුතු වන්නේ යම් මාසයක ද, ඒ මාසයේ අවසන් දිනයේ සිට දින පහළොවක් ඇතුළත සභාපතිවරයා විසින් රැස් කරගනු ලැබිය යුතු අතර, එය රැස් කරනු ලැබූ දිනයේ සිට දින හතක් ඇතුළත සභාපතිවරයා විසින් ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය. සභාපතිවරයා විසින් රැස් කරගන්නා ලද මුදල් ප්‍රමාණවල සියලු විස්තර දක්වනු ලබන ලිඛිත ප්‍රකාශයක් ද ඔහු විසින් මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා වෙත භාරදෙනු ලැබිය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් බද්ද එකතු කිරීම හා ප්‍රේෂණය කිරීමට අදාළ මාර්ගෝපදේශ කලින් කල, නිකුත් කරනු ලැබිය හැකි ය.”.

VI වන කොටස

**1995 අංක 16 දරන මුදල් පනතේ II වන කොටස සංශෝධනය කිරීම**

1995 අංක 16 දරන පනතේ 3 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**9.** (මේ කොටසේ මින්මතු “ප්‍රධාන ප්‍රඥප්තිය” යනුවෙන් සඳහන් කරනු ලබන) 1995 අංක 16 දරන මුදල් පනතේ 3 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :-

“සුඛෝපභෝගී මෝටර් වාහන වාර්ෂික බද්ද.

3. (අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහනයක් හෝ වැගන් රථයක් නොවන) සෑම සුඛෝපභෝගී මෝටර් වාහනයක් වෙනුවෙන් ම -

(අ) පළමුවෙන් ලියාපදිංචි කරනු ලබන වර්ෂය 2011 ජනවාරි මස 1 වන දිනයට පෙරාතුව වූ වර්ෂයක් වන අවස්ථාවක දී, 1995 අප්‍රේල් මස 1 වන දින සිට හෝ ඉන්පසුව ආරම්භ වන සහ 2011 ජනවාරි මස 1 වන දිනයට පෙරාතුව වූ සෑම වර්ෂයක් සඳහා, එහෙත් අවුරුදු හතකට නොවැඩි කාලයක් සඳහා, මේ පනතේ පළමුවන උපලේඛනයේ I වන කොටසේ පිළිවෙලින් දැක්වෙන ගෙවීම් ප්‍රමාණය මත; සහ

(ආ) පළමුවෙන් ලියාපදිංචි කරනු ලබන වර්ෂය 2011 ජනවාරි මස 1 වන දිනයේ දී හෝ එදිනට පසුව එළඹෙන වර්ෂයක් වන අවස්ථාවක දී, 2011 ජනවාරි මස 1 වන දින සිට හෝ ඉන් පසුව ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා, එහෙත් අවුරුදු හතකට නොවැඩි කාලයක් සඳහා මේ පනතේ පළමුවන උපලේඛනයේ II වන කොටසේ පිළිවෙලින් දැක්වෙන ගෙවීම් ප්‍රමාණය මත,

සුඛෝපභෝගී මෝටර් වාහන බද්දක් නියම කර අය කළ යුතු අතර ගෙවිය යුතු ද වන්නේ ය. ඒ සෑම වර්ෂයක් ම සඳහා ම ගෙවිය යුතු බද්ද

සුඛෝපභෝගී මෝටර් වාහනයේ ලියාපදිංචි අයිතිකරු විසින් අදාළ දිනයේ දී හෝ ඊට පෙර ගෙවිය යුතු ය.”.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :- ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

“අර්ධ සුබෝපභෝගී මෝටර් වාහන වාර්ෂික බද්ද.

4. (අර්ධ සුබෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහනයක් හෝ වැගන් රථයක් නොවන) සෑම අර්ධ සුබෝපභෝගී මෝටර් වාහනයක් වෙනුවෙන් ම-

(අ) පළමුවෙන් ලියාපදිංචි කරනු ලබන වර්ෂය 2011 ජනවාරි මස 1 වන දිනයට පෙරාතුව වූ වර්ෂයක් වන අවස්ථාවක දී, 1995 අප්‍රේල් මස 1 වන දින සිට හෝ ඉන්පසුව ආරම්භ වන සහ 2011 ජනවාරි මස 1 වන දිනයට පෙරාතුව වූ සෑම වර්ෂයක් සඳහා, එහෙත් අවුරුදු හතකට නොවැඩි කාලයක් සඳහා, මේ පනතේ දෙවන උපලේඛනයේ I වන කොටසේ පිළිවෙලින් දැක්වෙන ගෙවීම් ප්‍රමාණය මත; සහ

(ආ) පළමුවෙන් ලියාපදිංචි කරනු ලබන වර්ෂය 2011 ජනවාරි මස 1 වන දිනයේ දී හෝ එදිනට පසුව එළඹෙන වර්ෂයක් වන අවස්ථාවක දී, 2011 ජනවාරි මස 1 වන දින සිට හෝ ඉන්පසුව ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා, එහෙත් අවුරුදු හතකට නොවැඩි කාලයක් සඳහා, මේ පනතේ දෙවන උපලේඛනයේ II වන කොටසේ පිළිවෙලින් දැක්වෙන ගෙවීම් ප්‍රමාණය මත,

අර්ධ සුබෝපභෝගී මෝටර් වාහන බද්දක් නියම කර අය කළ යුතු අතර ගෙවිය යුතු ද වන්නේ ය. ඒ සෑම වර්ෂයක් සඳහා ම ගෙවිය යුතු බද්ද අර්ධ සුබෝපභෝගී මෝටර් වාහනයේ ලියාපදිංචි අයිතිකරු විසින් අදාළ දිනයේ දී හෝ ඊට පෙර ගෙවිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :-

"අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහන වාර්ෂික බද්ද.

5. (වැගන් රථයක් නොවන) සෑම අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහනයක් වෙනුවෙන් ම -

(අ) පළමුවෙන් ලියාපදිංචි කරනු ලබන වර්ෂය 2011 ජනවාරි මස 1 වන දිනයට පෙරාතුව වූ වර්ෂයක් වන අවස්ථාවක දී, 1995 අප්‍රේල් මස 1 වන දින සිට හෝ ඉන්පසුව ආරම්භ වන සහ 2011 ජනවාරි මස 1 වන දිනයට පෙරාතුව වූ සෑම වර්ෂයක් සඳහා, එහෙත් අවුරුදු හතකට නොවැඩි කාලයක් සඳහා, මේ පනතේ තුන්වන උපලේඛනයේ I වන කොටසේ පිළිවෙලින් දැක්වෙන ගෙවීම් ප්‍රමාණය මත; සහ

(ආ) පළමුවෙන් ලියාපදිංචි කරනු ලබන වර්ෂය 2011 ජනවාරි මස 1 වන දිනයේ දී හෝ එදිනට පසුව එළඹෙන වර්ෂයක් වන අවස්ථාවක දී, 2011 ජනවාරි මස 1 වන දින සිට හෝ ඉන්පසුව ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා, එහෙත් අවුරුදු හතකට නොවැඩි කාලයක් සඳහා, මේ පනතේ තුන්වන උපලේඛනයේ II වන කොටසේ පිළිවෙලින් දැක්වෙන ගෙවීම් ප්‍රමාණය මත,

අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහන බද්දක් නියම කර අය කළ යුතු අතර ගෙවිය යුතු ද වන්නේ ය. ඒ සෑම වර්ෂයක් සඳහා ම ගෙවිය යුතු බද්ද අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහනයේ ලියාපදිංචි අයිතිකරු විසින් අදාළ දිනයේ දී හෝ ඊට පෙර ගෙවිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) "සුඛෝපභෝගී මෝටර් වාහන සඳහා බදු ගෙවීමේ ප්‍රමාණ" යන ශීර්ෂයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් :-

"I වන කොටස

1995 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන එහෙත් 2011 ජනවාරි මස 1 වන දිනයට පෙරාතුව වූ යම් වර්ෂයක් සඳහාː-";

(2) පළමුවන උපලේඛනයේ අවසානයට පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන් ː-

"II වන කොටස

2011 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් වර්ෂයක් සඳහා

| | *වර්ෂය* | *ගෙවීම් ප්‍රමාණය (රු.)* |
|---|---|---|
| 1 | සුඛෝපභෝගී මෝටර් වාහනයක් ලියාපදිංචි කළ (2011 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන) වර්ෂය සඳහා | 100,000 |
| 2 | ඒ සුඛෝපභෝගී මෝටර් වාහනය (ලියාපදිංචි කළ වර්ෂය 2011 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන වර්ෂයක් වුව ද) ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන ප්‍රථම වර්ෂය සඳහා | 78,750 |
| 3 | ඒ සුඛෝපභෝගී මෝටර් වාහනය (ලියාපදිංචි කළ වර්ෂය 2011 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භවන වර්ෂයක් වුව ද) ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන දෙවන වර්ෂය සඳහා | 68,000 |
| 4 | ඒ සුඛෝපභෝගී මෝටර් වාහනය (ලියාපදිංචි කළ වර්ෂය 2011 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන වර්ෂයක් වුව ද) ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන තෙවන වර්ෂය සඳහා | 57,750 |
| 5 | ඒ සුඛෝපභෝගී මෝටර් වාහනය (ලියාපදිංචි කළ වර්ෂය 2011 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන වර්ෂයක් වුව ද) ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන සිව්වන වර්ෂය සඳහා | 48,000 |
| 6 | ඒ සුඛෝපභෝගී මෝටර් වාහනය (ලියාපදිංචි කළ වර්ෂය 2011 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන වර්ෂයක් වුව ද) ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන පස්වන වර්ෂය සඳහා | 38,750 |
| 7 | ඒ සුඛෝපභෝගී මෝටර් වාහනය (ලියාපදිංචි කළ වර්ෂය 2011 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන වර්ෂයක් වුව ද) ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන හයවන වර්ෂය සඳහා | 30,000 |
| 8 | ඒ සුඛෝපභෝගී මෝටර් වාහනය (ලියාපදිංචි කළ වර්ෂය 2011 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන වර්ෂයක් වුව ද) ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන හත්වන වර්ෂය සඳහා | නැත |

**නිදර්ශනය**

(අ) සුඛෝපභෝගී මෝටර් වාහනයක් 2007 අගෝස්තු මස 1 වන දින ලියාපදිංචි කර ඇත. ඒ සුඛෝපභෝගී මෝටර් වාහනය වෙනුවෙන් (ලියාපදිංචි කළ වර්ෂයෙන් පසුව එළඹෙන සිව්වන වර්ෂය වන) 2011 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වන වර්ෂය සඳහා ගෙවිය යුතු බද්ද රුපියල් 30,000 ක් වේ.

(ආ) සුඛෝපභෝගී මෝටර් වාහනයක් 2011 අගෝස්තු මස 1 වන දින ලියාපදිංචි කර ඇත. ඒ සුඛෝපභෝගී මෝටර් වාහනය වෙනුවෙන් 2011 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වන වර්ෂය සඳහා ගෙවිය යුතු බද්ද රුපියල් 100,000 ක් වේ.

(ඇ) සුඛෝපභෝගී මෝටර් වාහනයක් 2012 අගෝස්තු මස 1 වන දින ලියාපදිංචි කර ඇත. ඒ සුඛෝපභෝගී මෝටර් වාහනය වෙනුවෙන් (ලියාපදිංචි කළ වර්ෂයෙන් පසුව එළඹෙන ප්‍රථම වර්ෂය වන) 2013 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වන වර්ෂය සඳහා ගෙවිය යුතු බද්ද රුපියල් 78,750 ක් වේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කිරීම.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) "(අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහන නොවන) අර්ධ සුඛෝපභෝගී මෝටර් වාහන සඳහා බදු ගෙවීමේ ප්‍රමාණ" යන ශීර්ෂයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් :-

**"I වන කොටස**

1995 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන එහෙත් 2011 ජනවාරි මස 1 වන දිනයට පෙරාතුව වූ යම් වර්ෂයක් සඳහා :-";

(2) දෙවන උපලේඛනයේ අවසානයට පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන් :-

"II වන කොටස

2011 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් වර්ෂයක් සඳහා

| | *වර්ෂය* | *ගෙවීම් ප්‍රමාණය (රු.)* |
|---|---|---|
| 1 | අර්ධ සුඛෝපභෝගී මෝටර් වාහනයක් ලියාපදිංචි කළ (2011 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන) වර්ෂය සඳහා | 50,000 |
| 2 | ඒ අර්ධ සුඛෝපභෝගී මෝටර් වාහනය (ලියාපදිංචි කළ වර්ෂය 2011 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන වර්ෂයක් වුව ද) ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන ප්‍රථම වර්ෂය සඳහා | 39,375 |
| 3 | ඒ අර්ධ සුඛෝපභෝගී මෝටර් වාහනය (ලියාපදිංචි කළ වර්ෂය 2011 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන වර්ෂයක් වුව ද) ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන දෙවන වර්ෂය සඳහා | 34,000 |
| 4 | ඒ අර්ධ සුඛෝපභෝගී මෝටර් වාහනය (ලියාපදිංචි කළ වර්ෂය 2011 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන වර්ෂයක් වුව ද) ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන තෙවන වර්ෂය සඳහා | 28,875 |
| 5 | ඒ අර්ධ සුඛෝපභෝගී මෝටර් වාහනය (ලියාපදිංචි කළ වර්ෂය 2011 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන වර්ෂයක් වුව ද) ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන සිව්වන වර්ෂය සඳහා | 24,000 |
| 6 | ඒ අර්ධ සුඛෝපභෝගී මෝටර් වාහනය (ලියාපදිංචි කළ වර්ෂය 2011 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන වර්ෂයක් වුව ද) ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන පස්වන වර්ෂය සඳහා | 19,375 |
| 7 | ඒ අර්ධ සුඛෝපභෝගී මෝටර් වාහනය (ලියාපදිංචි කළ වර්ෂය 2011 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන වර්ෂයක් වුව ද) ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන හයවන වර්ෂය සඳහා | 15,000 |
| 8 | ඒ අර්ධ සුඛෝපභෝගී මෝටර් වාහනය (ලියාපදිංචි කළ වර්ෂය 2011 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන වර්ෂයක් වුව ද) ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන හත්වන වර්ෂය සඳහා | නැත |

ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය සංශෝධනය කිරීම.

14. ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) "අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහන සඳහා බදු ගෙවීමේ ප්‍රමාණ" යන ශීර්ෂයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් :-

" I වන කොටස

1995 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන එහෙත් 2011 ජනවාරි මස 1 වන දිනයට පෙරාතුව වූ යම් වර්ෂයක් සඳහා :-";

(2) තුන්වන උපලේඛනයේ අවසානයට පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන් :-

"II වන කොටස

2011 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් වර්ෂයක් සඳහා

| | *වර්ෂය* | *ගෙවීම් ප්‍රමාණය (රු.)* |
|---|---|---|
| 1 | අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහනයක් ලියාපදිංචි කළ (2011 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන) වර්ෂය සඳහා | 20,000 |
| 2 | ඒ අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහනය (ලියාපදිංචි කළ වර්ෂය 2011 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන වර්ෂයක් වුව ද) ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන ප්‍රථම වර්ෂය සඳහා | 15,750 |
| 3 | ඒ අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහනය (ලියාපදිංචි කළ වර්ෂය 2011 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන වර්ෂයක් වුව ද) ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන දෙවන වර්ෂය සඳහා | 13,600 |
| 4 | ඒ අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහනය (ලියාපදිංචි කළ වර්ෂය 2011 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන වර්ෂයක් වුව ද) ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන තෙවන වර්ෂය සඳහා | 11,550 |

| | | |
|---|---|---|
| 5 | ඒ අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහනය (ලියාපදිංචි කළ වර්ෂය 2011 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන වර්ෂයක් වුව ද) ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන සිව්වන වර්ෂය සඳහා | 9,600 |
| 6 | ඒ අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහනය (ලියාපදිංචි කළ වර්ෂය 2011 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන වර්ෂයක් වුව ද) ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන පස්වන වර්ෂය සඳහා | 7,750 |
| 7 | ඒ අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහනය (ලියාපදිංචි කළ වර්ෂය 2011 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන වර්ෂයක් වුව ද) ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන හයවන වර්ෂය සඳහා | 6,000 |
| 8 | ඒ අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහනය (ලියාපදිංචි කළ වර්ෂය 2011 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන වර්ෂයක් වුව ද) ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන හත්වන වර්ෂය සඳහා | නැත |

**15.** මේ පනතේ මේ කොටස මගින් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධන සියලු කාර්ය සඳහා 2011 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

අතීතයට බලපෑම.

**16.** 2011 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වී, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමේ දිනය දක්වා වූ කාලය තුළ යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් විසින්, මේ පනතේ මේ කොටසේ විධිවිධාන සලසා තිබෙන පරිදි බදු එකතු කරගන්නේ ද, ඒ තැනැත්තා නිසි බලය ඇතිව ක්‍රියා කර ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ බදු එකතු කරගැනීම වලංගු ආකාරයෙන් කරනු ලැබ ඇති හා කරන ලද ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු අතර, එසේ බදු එකතු කිරීම හා සම්බන්ධ සියලු සිවිල් හෝ අපරාධ නඩුවලට එරෙහිව මෙයින් වගකීමෙන් මුක්ත කරනු ලැබේ.

වගකීමෙන් මුක්ත කිරීම.

**17.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.